.

# වාතරක්ත චිකිත්සාවේ දී රසකිඳ යොදනු ලබන සංස්කරණ විධි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනය

අමාලි ප්‍රියන්ගිකා ජයතුංග එච් ඩී[1] , ජයසිංහ ජේ එම් පී ආර් කේ [2]
[1]ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය
[2]ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය

**සංක්ෂිප්තය**

වාතරක්ත රෝගය වර්තමානයේ බහුලව දැකිය හැකි රෝග තත්වයක් ලෙස සායනික නිරීක්ෂණ මගින් පෙන්වා දිය ඇති අතර ඒ සඳහා ආයුර්වේද ප්‍රතිකාර ලබාගැනීමට සැලකියයුතු රෝගීන් ප්‍රතිශතයක් වාතී වන බවද පැහැදිලි වේ. මෙහිදී විවිධ වෛද්‍යවරුන් විසින් සිය ප්‍රායෝගික අත්දැකීම් හා පාරම්පරික දැනුම යොදාගනිමින් විවිධ ප්‍රතිකාර පද්ධතීන් භාවිතා කරන බවත් ඒ සඳහා රසකිඳ සංස්කරණ විධි යෝගයන්ට විශේෂ තැනක් ලබා දෙන බවද පෙනී යයි. කිළිටිව පවතින දෝෂයන් පිරිසිදු නොකොට, සමානව පවතින දෝෂ කිපීමක් ද නොකොට, විෂමව පවත්නා දෝෂයන් සම කොට ලන ද්‍රව්‍යයන් ශමන ද්‍රව්‍ය අතර රසකිඳ ප්‍රධාන වේ. වාතරක්ත රෝගය සඳහා බහුලවම භාවිතා කරනු ලබන රසකිඳ සංස්කරණ විධි හඳුනා ගෙන ඒවා වැඩි දියුණු කිරීම කාලෝචිත වේ. ආයුර්වේද, දේශිය, නවීන වෛද්‍ය විද්‍යාවට අයත් මූලාශ්‍ර වලින්ද, අන්තර්ජාල ආශ්‍රයෙන්ද, අහඹු ලෙස තෝරා ගත් ආයුර්වේද වෛද්‍යවරු සිය දෙනෙක් හමු වී ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කර තොරතුරු ලබා ගැනීම මාර්ගයෙන් පර්යේෂණය සිදුකරන ලදී. මූලාශ්‍ර ගත තොරතුරු හා ප්‍රායෝගික චිකිත්සාවේ දී වෛද්‍යවරුන්ගෙන් ලද තෙරතුරු සංසන්දනය කිරීම උදෙසා ඉහතින් සඳහන් කළ ග්‍රන්ථ ගත තොරතුරු ඇසුරින් වාතරක්ත චිකිත්සාවේ දී බහුලවම භාවිතා වී ඇති රසකිඳ සංස්කරණ විධි පිළිබඳව විශේෂ අවධානයක් යොමුකළ අතර එය ප්‍රශ්නාවලිය ඇසුරින් ලත් තොරතුරු සමඟ සංසන්දනය කරන ලදී. එහිදී ලබාගත් නිගමන වලට අනුව ග්‍රන්ථ ගත චිකිත්සාව හා ප්‍රායෝගික චිකිත්සාව බොහෝ සෙයින් සමාන වුවද වෙනස් වන අවස්ථාද පවතින බව අවබෝධ විය. කෙසේ වෙතත් මේ සියළු කරුණු ඇසුරින් රසකිඳ, වාතරක්ත චිකිත්සාවේ දී ස්වරස, ක්වාථ, අරිෂ්ට, ආසව, පිෂ්ඨී, කල්ක, අනුපාන, ඝෘත, ගුග්ගුලු, ලෞහ, ආදී විවිධ සංස්කරණ විධි යටතේ බහුලවම යොදා ගනු ලබන බව පැහැදිලි වන කරුණකි. මූලාශ්‍ර ගත දත්ත හා ප්‍රායෝගික චිකිත්සාවට අනුව වාතරක්ත චිකිත්සාවේදී බහුලවම භාවිතා කරනු ලබන සංස්කරණ විධිය ලෙස **ක්වාථ** දැක්විය හැක. ප්‍රායෝගික චිකිත්සාවේදී අනුපාන හා තෛල ලෙසත් භාවිතා වන අතර මූලාශ්‍ර ගතව වැඩි වශයෙන් දක්වා ඇත්තේ පිෂ්ඨී හා ස්වරස පිළිබඳව වේ. මූලග්‍රන්ථ ගත නමුත් ප්‍රායෝගිකව වාතරක්ත චිකිත්සාවේදී භාවිතයේ නොපවතින රසකිඳ අඩංගු ඖෂධ යෝගයන් පිළිබඳ පර්යේෂණ සිදු කිරීම හා ඒවායේ යෝග්‍යතාවය පිළිබඳ විමර්ශනයක් සිදුකිරිම වැදගත් වේ.

**e-mail:** a.p.jayathunga@gmail.com